**ශීර්ෂය 274 - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 274, අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 නොවැම්බර් 11 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම.

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්.**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 856.10 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 826.97 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලෙකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 29.13 ක් හෙවත් සියයට 3.40 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 776.10 | 773.74 | 2.36 | 0.30 |
| මූලධන | 80.00 | 53.23 | 26.77 | 33.46 |
| **එකතුව** | **856.10** | **826.97** | **29.13** | **3.40** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 14 ක් හා දෙපාර්තමේන්තු 15 ක් විසින් එකතුව රු. මිලියන 2,579.81 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 2,248.81 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 331.00 ක් හෙවත් සියයට 12.83 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

2.2 අත්තිකාරම් ගිණුම

2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම.

පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 27401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 56.50 | 54.30 | 42.00 | 48.96 | 225.00 | 168.38 |

2.3 අග්‍රිම ගිණුම.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.210,872 ක් විය.

2.4 පොදු තැන්පත් ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 800.72 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0017/0021/000 | 12.01 |
| 6000/0000/00/0002/0120/000 | 0.20 |
| 6000/0000/00/0001/0090/000 | 0.75 |
| 6000/0000/00/0013/0080/000 | 41.53 |
| 6000/0000/00/0016/0069/000 | 458.52 |
| 6000/0000/00/0019/0018/000 | 0.31 |
| 6000/0000/00/0011/0601/000 | 287.40 |
| එකතුව | 800.72 |

2.5 විගණන නිරීක්ෂණය

------------------------

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 3 ඡේදයේ සඳහන් කර ඇත.

3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ.

---------------------------------------------

3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

-------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණු අතර 1978 දෙසැම්බර් 19 දිනැති අංක 402 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

3.2 විගණන විමසුම්වලට පිළිතුරුදීම

-------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 02 කට 2016 ජූනි 15 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළහැකි ගනුදෙනුවල වටිනාකම රු.48,429,693 ක් වී තිබුණි.

3.3 අග්‍රිම ගිණුම්.

--------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2016 අප්‍රේල් 30 දින වන විට පියවා නොතිබුණු අග්‍රිම ගිණුමකට අදාළ ශේෂවල එකතුව රු.210,872 ක් වී තිබුණි. එය 2010 වර්ෂයේ සිට පැවැත එන ශේෂයක් විය.

3.4 පොදු තැන්පත් ගිණුම.

------------------------

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. මිලියන 299.77 ක් වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය.

------------------------------------------------------------------------

විෂය අංක 27401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව ස්ථානමාරු වීම, වැඩ තහනම් වීම හා විශ්‍රාම ගැන්වීම ආදී හේතු මත 2015 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 1 ක සිට වර්ෂ 08 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණු ශේෂවල එකතුව රු.3,765,196 ක් වී තිබුණි. එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව නිලධාරියෙකුට ගෙවිය හැකි උපරිම ආපදා ණය මුදල රු.250,000 ක් විය යුතු වුවත්, එම සීමාව ඉක්මවා ආපදා ණය ගෙවීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට නිලධාරියෙකුගේ ආපදා ණය ශේෂය රු.289,675 ක් වී තිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.

පහත වර්ග කර ඇති පරිදි වත්කම් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ නිෂ්ක්‍රීයව පැවති බව භෞතික විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | | ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| (i) | වාහන ගරාජ ඇතුළු පැරණි ගොඩනැගිලි | අනුමැතියෙන් තොරව දීර්ඝ කාලයක සිට වසා දමා තිබුණි. |
| (ii) | විදුලිජනක යන්ත්‍ර 02 | දීර්ඝ කාලයක සිට අක්‍රීයව පවතී |
| (iii) | වාහන 02 | දීර්ඝ කාලයක සිට භාවිතයෙන් ඉවත් කර තිබුණි. |

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උතුරුමැද පළාත් සභාවේ සේවයේ නියුතු නිලධාරීන් පිරිසක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු නිවාස 18 ක පදිංචි වී සිටින අතර, එම නිවාස පළාත් සභාව වෙත පවරා දීමට හෝ ආපසු අත්පත් කර ගැනීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද, නිවාස කුලී අයකරගැනීමද සිදුකර නොතිබුණි.

(ii) අනුරාධපුර පැරණි නගරයේ පිහිටි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු නිවාසයක 2004 වර්ෂයේ සිට තිසාවැව නේවාසික ව්‍යාපාර කළමනාකරණ ආයතනය පවත්වා ගෙන යනු ලබන අතර, එම වර්ෂයේ සිටම නිවාස කුලී අයකර ගෙන නොතිබුණි.

3.7 අනුකූල නොවීම්.

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන | | |
| 1981 අංක 27 දරන ඉඩම් සංශෝධන පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 8 වන වගන්තිය | - | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පවතින රක්ෂිත ඉඩම් හඳුනාගෙන ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 371(5) | 583,425 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් 24 දෙනෙකු වෙත අවස්ථා 38 කදී ලබාදී තිබුණු අත්තිකාරම් ප්‍රමාද වී පියවා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396(ඇ) | 16,469,255 | බැංකු ජංගම ගිණුම් 17 කට අදාළව නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| (iv) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2.1.1 ඡේදය. | - | නියැදි විගණන පරීක්ෂාවට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක සංචිත වාහන 07 ක ඉන්ධන දැවීම පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| (ඇ) ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ | | |
| 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/4 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 1.3.3. ඡේදය | - | තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් නොමැති තැනැත්තන්ගේ ලියාපදිංචි ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |

(ඉ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපි

----------------------------------------

| | | | |
|---|---|---|---|
| (i) | 2011 මාර්තු 31 දිනැති අංක HAF-2/19/MGTCM/15/1907 දරන ලිපිය | 21,728 | රාජාංගනය ප්‍රාදේශීය ලේකම් තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා ගල්නෑව ප්‍රාදේශීය ලේකම් ලෙස කටයුතු කළ පරිපාලන සේවය III ශ්‍රේණියේ නිලධාරියෙකු වෙත වැඩිපුර දීමනා ගෙවා තිබුණි. |
| (ii) | ඉහත ලිපියේ 02 ඡේදය | - | රාජාංගනය ප්‍රාදේශීය ලේකම් තනතුරේ රාජකාරි ඉටු කරන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරිනියක්, දිස්ත්‍රික් ලේකම්ගෙන් අනුමැතියක් ලබා නොගෙන 2014 වර්ෂයේදී මාස 04 ක් සහ 2015 වර්ෂයේ මාස 03 කදී ඉන්ධන ලීටර් 1440 ක් ලබාගෙන තිබුණු අතර, ධාවනයට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණයට වඩා ඉන්ධන ලීටර් 344 ක් වැඩිපුර ලබාගැනීමද එයට ඇතුළත්ව තිබුණි. |
| (iii) | 2013 පෙබරවාරි මස (දින රහිතව) නිකුත් කර තිබුණු HAF-3-CIRCUIT General-025 චක්‍රලේඛයේ 12.1 ඡේදය | 1,760,315 | අනුරාධපුර සංචාරක නිවාසයේ භාරකරු විසින් සංචාරක නිවාසයේ නවාතැන් නොගත් තැනැත්තන් වෙත 2015 වර්ෂයේදී පිසූ හා වෙනත් ආහාර සැපයීම් වෙනුවෙන් අවස්ථා 27 කදී බිල්පත් නිකුත් කර තිබුණි |

## 3.8 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

----------------------------------------------------------

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම.

------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කළ යුතුව තිබුණු, ඇස්තමේන්තුගත පිරිවැය රු.11,591,928 ක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 කට අදාළ ව්‍යාපෘති 18 ක් අධික වර්ෂාව පැවතීම හා කොන්ත්‍රාත්කරු විසින් වැඩ ආරම්භ නොකිරීම නිසා ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර තිබුණි.

(ආ ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). ඇස්තමේන්තුගත වටිනාකම රු.22,829,231 ක් වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කට අදාළ විවිධ ව්‍යාපෘති 28 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.8,896,069 ක් වැය කර තිබුණි. වර්ෂාව පැවතීම සහ ව්‍යාපෘති වැඩ නැවැත්වීම නිසා එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි..

(ii). දොරින් දොරට - ගමින් ගමට සංවර්ධන වැඩසටහන 2014 යටතේ රාජාංගන හන්දිය සතිපොල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 10 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එම ව්‍යාපෘති සම්බන්ධයෙන් රු.මිලියන 9.90 ක කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. නමුත් ඒ සඳහා නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබීම, රාජාංගනය ප්‍රාදේශීය සභාවේ එකඟතාවයක් ලබාගෙන නොතිබීම සහ ප්‍රාදේශීය ලේකම්ගේ හා දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගේ අධීක්ෂණයක් මත ඉදිකිරීම් සිදු කර නොතිබුණි. මේ නිසා ව්‍යාපෘතිය අතරමඟ නවතා දැමීම නිසා එයින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගෙන නොතිබුණි.

**(ඇ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්.**

පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණත්, ඒවා නිම කළ යුතුව තිබුණු කාල වකවානු ඉක්මවා ති/බුණත්, එම ව්‍යාපෘති 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | 2015 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | | | රු. | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘති 07 ක් | 54.48 | 2015 සැප්තැම්බර් - නොවැම්බර් | 2015 දෙසැම්බර් | 20.45 | වර්ෂය අවසානයේ වැඩ ආරම්භ කිරීම හේතුවෙන් අධික වර්ෂාව පැවතීම නිසා ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි වීම |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කට අදාළ විවිධ ව්‍යාපෘති 48 ක් | 50.49 | 2015 ඔක්තෝබර් | 2015 දෙසැම්බර් | 25.23 | - එම - |

(ඇ) මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති.

ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2009 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අශ්වයාබැඳිවැව පානීය ජල ව්‍යාපෘතිය සඳහා රු.18,128,075 ක් වියදම් කර තිබුණි. නමුත්

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබීම සහ ව්‍යාපෘතිය අධීක්ෂණය කරන ලද නිලධාරීන්ගේ නොසැලකිල්ල යන කරුණු හේතුවෙන් 2016 මාර්තු මාසය වන විටත් එම ව්‍යාපෘතියෙන් ප්‍රදේශවාසීන්ට ජලය ලබාදීමට නොහැකි වී තිබුණි.

(ඉ) භාණ්ඩ හා සේවා සැපයීම් රහිතව මුදල් නිදහස් කිරීම.

2015 වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 ක කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු පලතුරු ගම්මාන ව්‍යාපෘතියට කෘෂි උපකරණ සහ පලතුරු පැල සැපයීම සඳහා 2015 දෙසැම්බර් 31 දින රු.4,116,100 ක් සැපයුම්කරුට ගෙවා තිබුණි. එම මුදලින් රු.1,432,220 කට අදාළ ගෙවීම් වෙනුවෙන් වූ කෘෂි උපකරණ සහ පලතුරු පැල 2016 පෙබරවාරි 25 දින වන විටත් සපයා නොතිබුණි.

**(ඊ) ව්‍යාපෘති ප්‍රතිලාභ ජනතාවට නොලැබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අනුරාධපුර සති වෙළඳපොලේ මාළු කඩ කාමර 30 ක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර එහි පළමු අදියර සඳහා රු.5,927,222 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. නමුත් අනුමත සැලැසුමට, ඉංජිනේරුමය ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට පටහැනිව මාළු කඩ කාමර වෙනුවට සාමාන්‍ය කඩ කාමර 08 ක් ඉදිකර තිබුණි. ඒ සඳහා කොන්ත්‍රාත්කරුට රු.4,477,042 ක් 2015 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. ඒ අනුව මූලික අරමුණට පටහැනිව සාමාන්‍ය කඩ කාමර ඉදිකර තිබීමත්, එම කඩ කාමර ද භාවිතයට නොගෙන නිෂ්කාර්යව තිබීමත් නිසා සති පොල භාවිතා කරන ප්‍රජාවට අදාළ ප්‍රතිලාභ ලැබී නොතිබුණි.

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.59,338,821 ක් වැය කර මහන මැෂින් 43 ක්, පාපැදි 13 ක්, ධීවර බෝට්ටු හා උපකරණ 91 ක්, ජල පොම්ප 360 ක්, කෘෂි උපකරණ අයිතම 89209 ක්, ක්‍රීඩා උපකරණ කට්ටල 86 ක් හා අනෙකුත් ස්වයං රැකියා උපාංග කට්ටල 5921 ක් මිලදී ගෙන තිබුණි. 2016 ජූනි 15 දින වන විටත් අදාළ ප්‍රතිලාභීන්ට එම භාණ්ඩ හා උපකරණ බෙදා දී නොතිබුණි.

(උ) වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වියදම් ලෙස ගිණුම්ගත කිරීම

හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ 2 අදියරේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් ලෙස 2015 ඔක්තෝබර් 05 දින රු.1,260,910 ක් ගෙවා තිබුණි. එසේ ගෙවා තිබුණු අත්තිකාරම් වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

3.9 කාර්යසාධනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන්ගෙන් සියයට 50 ක ණය අයකර ගැනීමේ පදනම මත 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ව්‍යාපෘති 17,889 ක් සඳහා රු.117,319,173ක් වැය කර තිබුණි. එම වියදමෙන් 2016 ජූනි 30 දින වන විට තවදුරටත් රු.12,694,413 ක් අයවීමට තිබුණි.

(ආ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 කට අයත් රජයේ ඉඩම්වල පදිංචි වී සිටින වගා කරනු ලබන ගොවීන් වෙත එම ඉඩම් ලබාදීම සඳහා ජනාධිපතිවරයා විසින් අත්සන් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත එවා තිබෙන දීමනා පත්‍ර 3898 ක් වර්ෂ 03 ක සිට වර්ෂ 21 ක් දක්වා කාල පරාසයක් ගතවී තිබුණත්, අදාළ ප්‍රතිලාභීන් වෙත එම දිමනා පත්‍ර නිකුත් කිරීම කටයුතු කර නොතිබුණි.

(ඇ) ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජයේ ඉඩම් සඳහා දීමනා පත්‍ර සැකසීමට අත්‍යවශ්‍ය රේඛා චිත්‍ර ලබාදීම මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සිදු කර නොතිබීම හේතුවෙන් 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ඉඩම් කට්ටි 1327 ක් වෙනුවෙන් බලපත්‍ර සකස් කිරීම ප්‍රමාද වී තිබුණි.

3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු.
-------------------------------------

ගැලපුම් කළයුතු ශේෂ.
------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 දෙසැම්බර් මාසය අවසානයට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව නිකුත් කර තිබුණත්, ගෙවීම් සඳහා බැංකුව වෙත ඉදිරිපත් ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ චෙක්පත්වල වටිනාකම රු.මිලියන 16.47 ක් වී තිබුණි. මෙම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

3.11 අවිධිමත් ගනුදෙනු
---------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වු එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපරිපාටියෙන් බැහැරවීම්.
-----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු නොකර කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත වැන්දඹු කාන්තාවන් දිරිගැන්වීමේ වැඩසටහන සඳහා සීමිත මිල ගණන් කැඳවා රු.12,627,574 ක භාණ්ඩ හා උපකරණ මිලදී ගෙන තිබුණි. එක් එක් විෂයය සඳහා සැපයුම්කරුවන් 16 ක සිට 31 ක් දක්වා ප්‍රමාණයක් ලියාපදිංචිව සිටියදී ඉහත මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන් 09 දෙනෙකුගෙන් පමණක් මිලගණන් කැඳවා තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 මාර්ගෝපදේශය ප්‍රකාරව දෙපාර්තමේන්තු තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා, ප්‍රසම්පාදන ආයතනයට බාහිර ආයතනයක නිලධාරියෙකු පත් කර ගැනීමකින් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක නිර්දේශය මත 2015 වර්ෂයේදී රු.69,096,906 ක් වටිනා ඉදිකිරීම් ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කර තිබුණි.

(iii) අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ පිහිටි ආපන ශාලාව පවත්වාගෙන යාම සඳහා 2015/2016 වර්ෂයට බදුකරුවෙකු තෝරා ගැනීමේ කාර්යයේදී තරඟකාරී මිල ගණන් ලබාගැනීම සඳහා කටයුතු කර නොතිබුණු අතර, දීර්ඝ කාලයක සිට එකම තැනැත්තෙකු විසින් ප්‍රමාණවත් බදු මුදල් ගෙවීමකින් තොරව ආපන ශාලාව පවත්වා තිබුණි.

(iv) ජාතික සවිය ගම නැගුම වැඩසටහනේ ප්‍රතිපාදන යටතේ 2009 වර්ෂයේදී ආරම්භ කර 2012 වර්ෂය දක්වා රු.18,128,075 ක වටිනාකමකට ක්‍රියාත්මක කර තිබුණු ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අශ්වයාබැඳිවැව ජල ව්‍යාපෘතිය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු කැඳවීමට කටයුතු නොකර ව්‍යාපෘතිය කොටස් 09 කට බෙදා සමෘද්ධි ගම්මාන සමිති 12 ක් වෙත කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.

(ආ) අධිකාරී බලය නොමැති වූ ගනුදෙනු.

-------------------------------------

අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවකට සීමිත මිල ගණන් යටතේ වැඩ ඉටුකර ගැනීම සඳහා රුපියල් මිලියන 20 ක් දක්වා පමණක් අනුමැතිය ලබාදිය හැකි වුවත්, හා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව විසින් සීමිත මිල ගණන් යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා, රු.20,175,717 ක කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි.

3.12 පාඩු හා හානි

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් අනුරාධපුර පිහිටි සංචාරක නිවාසයේ 2013 ජනවාරි මාසයේ සිට 2015 ඔක්තෝබර් මාසය දක්වා මාසික ජල ගාස්තු නියමිත දිනට නිරවුල් නොකිරීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු.24,331 ක් ගෙවා තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 03 කට සිදුවී තිබුණු අනතුරු හේතුවෙන් එම වාහන අලුත්වැඩියා කිරීම සඳහා රු.4,330,272 ක් වැය කර තිබුණි. ඒ සඳහා රක්ෂණ වන්දි ලෙස රු.3,964,844 ක් පමණක් ලැබී තිබීම නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට රු.392,428 ක අලාභයක් සිදුවී තිබුණි.

3.13 අනාර්ථික ගනුදෙනු.

-----------------------

2015 වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 08 ක කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද පලතුරු ගම්මාන ව්‍යාපෘතිය යටතේ රු.2,880,000 ක් ගෙවීම් කර මිලදී ගෙන ප්‍රතිලාභීන් වෙත බෙදා දී තිබුණු පළතුරු පැල 19,700 කින් රු.934,580 ක් වටිනා පැල 7492 ක් විනාශ වී තිබුණි.

3.14 කළමනාකරණ දුර්වලතා.

----------------------------

ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති ප්‍රමාදවීම් සඳහා කල් දිගු කිරීම් අනුමත නොකරන ලද වටිනාකම රු.15,204,259 ක් වූ ව්‍යාපෘති 15 කින් ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.15 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 93 | 78 | 15 | -- |
| (ii) | තෘතීයික මට්ටම | 76 | 40 | 36 | -- |
| (iii) | ද්විතීයික මට්ටම | 1992 | 1639 | 353 | -- |
| (iv) | ප්‍රාථමික මට්ටම | 219 | 199 | 16 | 04 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික කොන්ත්‍රාත් පදනම) | 2 | 2 | 0 | -- |
| | **එකතුව** | **2,382** | **1,958** | **420** | **04** |